

# 21

# හදීස් - II

ඉස්ලාමයේ ප්‍රධාන කොටස් දෙක අතරින් දෙවැන්න 'අස්සුන්නාහ්' වේ. එම නිසා, එය ආරක්ෂා කිරීමේ සේවය සහාබිවරුන්ගේ කාලයේ සිට ඉස්ලාමීය සමාජයේ විසූ සුවිශේෂී විද්වත්හු දියත් කළහ. සහාබිවරුන්ගේ කාලයේ දී හදීස් කටපාඩමින් හුවමාරු විය. තාබිඊන්වරුන්ගේ කාලයේ දී එම හදීස් ලේඛණගත කිරීමේ සේවයට ප්‍රමුඛස්ථානයක් ලබා දෙමින් එක් රැස් කරන ලදි. මක්නිසාදයත්, පසුකාලීනව හදීස්වලට හිමි මහිමය උපයෝගී කරගනිමින් විවිධ පිරිස් තම තමන්ගේ කණ්ඩායමට බලය ලබා ගැනීමට හදීස් ගෙතූහ. මෙම අවදානමෙන් සුන්නාහ්ව හා මුස්ලිම් සමාජය ආරක්ෂා කර ගැනීමේ මහඟු සේවය, ඒ ඒ වකවානුවල විසූ හදීස් ක්ෂේත්‍රයේ විද්වත්හු දියත් කළහ. එම පදනම මත හදීස් තරාතිරම් අනුව වෙන් කර ඒවා ගොනු කිරීමේ ක්‍රියාවලිය සිදු විය.

සහාබිවරුන්, තාබිඊන්වරුන් හා ඔවුන්ට සමගාමීව ශ්‍රේෂ්ඨ විද්වතුන් රැසක් ම 'හදීස්' ක්ෂේත්‍රයේ ආරක්ෂාවට හා වර්ධනයට අදාළ ව මෙම මහඟු සේවයෙහි නියැලුණහ. ඔවුන් අතරින් 'ආයිෂා' රළියල්ලාහු අන්හා තුමිය, අබූ හුරෛරා රළියල්ලාහු අන්හු තුමා, අබ්දුල්ලාහ් ඉබ්නු උමර් රළියල්ලාහු අන්හු තුමා, අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු තුමා, ඉමාම් අබ්දුල්ලාහ් බින් මුබාරක් තුමා, ඉමාම් ඉබ්නු ෂිහාබ් අස්සුහ්රී තුමා, සඊද් ඉබ්නු මුසයියබ් තුමා, ඉමාම් බුහාරි තුමා, ඉමාම් මුස්ලිම් රහ්මහුල්ලාහ් තුමා යන බොහෝ දෙනෙක් විශේෂ වෙති.

කාලීන අවශ්‍යතා ව හා හදීස්හි ආරක්ෂාව තකා ගනු ලැබූ ක්‍රියාමාර්ග අතරින් "ඉස්නාද්" හඳුන්වා දීම වැඩි ම වැදගත්කමක් දරන අංශයක් ලෙස සැලකිය හැකි ය. එසේ ම සුන්නාහ්වෙහි විශ්වසනීයත්වය හා ආරක්ෂාව ස්ථිර කරන්නේ ය. 'ඉස්නාද්' හා සබැඳි ව ඊට සහය දෙමින් අස්මාඋර්රිජාල්, ඉල්මුල් ජරහ් වත්තඃදීල් වැනි විශේෂ අංශ වර්ධනය විය. මේ සියල්ල අදාල වන ලෙසින් උලූමුල් හදීස් නැතහොත් ඉල්මුල් මුස්තලහ් යන ක්ෂේත්‍ර ද දක්නට ඇත.

'ඉස්නාද්' නම් හදීස් නිවේදනය කරන්නන්ගේ අනුපිළිවෙළෙහි අන්තර්ගත වන රාවිවරුන්ගේ (හදීස් නිවේදනය කරන්නන්) සංඛ්‍යාව, අනුපිළිවෙළ අඛණ්ඩ බව ඔවුන්ගේ මතක ශක්තිය,

විශ්වසනීයත්වය, ආගමික පසුබිම යනාදියෙහි ඔවුන් සතු සුවිශේෂ ගුණාංග පාදක කර ගෙන 'හදීස් සහීහ්', 'හසන්', 'ලඊෆ්', යැයි විවිධ තරාතිරම්වලට බෙදූ ඇත.

**සහීහ්**:

මෙවැනි හදීස්හි අත්‍යවශ්‍ය සියලු ම ගුණාංග අන්තර්ගත වන බව දැක ගත හැකි ය. මෙහි රාවිවරුන්ගේ අනුපිළිවෙළ නොබිඳී එහි අන්තර්ගත වන සියලු ම රාවිවරුන් ද විශ්වසනීයත්වයෙන් යුක්ත වූ අය බව සියල්ලන් විසින් ම පිළිගෙන ඇත. "සහීහ්" යන උසස් තත්ත්වය ලබා ඇති මෙවැනි හදීස් පිළිගැනීමත් එය ජීවිතයෙහි පිළිපැදීමත් මුස්ලිම්වරුන්ගේ වගකීමකි. එය ප්‍රතික්ෂේප කිරීම, දේව ධර්ම දූත මෙහෙවර ප්‍රතික්ෂේප කිරීම හා සමාන වේ.

**හසන්**:

'සහීහ්' වන හදීස්හි ගුණාංග තිබුණ ද රාවිවරුන්ගේ මතක ශක්තිය හීන වූ (එහෙත් දුර්වල නොවන) කෙනෙකු දැනුම් දෙන්නේ නම් එම හදීස් හසන් තත්ත්වයෙහි ලා සැලකේ. මෙවැනි හදීස් ද සහීහ් වන හදීස් ලෙස ම මූලාශ්‍ර ලබා ගැනීම, ක්‍රියාවට නැංවීම යනාදියට භාවිත කරනු ලැබේ.

**ලඊෆ්**:

හසන් යන තත්ත්වය සහිත හදීසයෙන් අත්‍යවශ්‍ය මූලික ගුණාංගයන්හි අඩුපාඩු දිස් වන කල එය දුර්වල හදීස් (ලඊෆ්) නම් වර්ගයට අයත් වේ.

මෙලෙස හදීස් එක් රැස් කර ඒවා දැඩි අවධානයෙන් නිරීක්ෂණය කර පැහැදිලි කිරීමේ කර්තව්‍යයෙහි ඉමාම්වරු රැසක් එදා සිට අද දක්වා කැපවීමෙන් නියැලී සිටිති. ඔවුන්ගේ මෙම සේවාවෙහි ප්‍රතිඵලයන් ලෙස විවිධ ස්වරූපයෙන් දහස් ගණන් 'හදීස්' පහසුවෙන් ලබා ගැනීමට හැකි වී ඇත.

එලෙස සේවය කළ විද්වතුන් අතරින් ප්‍රධාන හදීස් ග්‍රන්ථ හයෙහි කර්තෘ ඉමාම්වරු සුවිශේෂ වෙති. ඔවුහු ඉදිරිපත් කළ ග්‍රන්ථ **'අස් සිහාහුස් සිත්තා'** යන නමින් ඇමතෙයි.

තවද **කුතුබුස් සිත්තා, සහීහෛන් වසුනන් අර්බආ** යන නම්වලින් ද ආමන්ත්‍රණය කෙරෙයි. කෙසේ වෙතත් අල් කුර්ආනයට පසු සහීහෛන් තත්ත්වය ලබා දෙන සහීන් බුහාරි සහ සහීන් මුස්ලිම් ග්‍රන්ථ දක්නට ලැබේ.

ඒවාට පසු තත්ත්වයේ **'සුනන් අර්බආ'** ලෙසට විරුදාවලිය ලත් තිර්මිදි, ඉබ්නු මාජා, අබූදාවූද්, නසඊ නම් වූ හදීස් ග්‍රන්ථ හතර දක්නට ඇත. මෙවැනි වෙනත් බොහෝ හදීස් ග්‍රන්ථ ද ඇත.

**එම නිසා හදීස්හි වැදගත්කම හා විශිෂ්ටත්වය වටහා ගෙන, පිළිගෙන ජීවිතය තුළ ඒවා පිළිපැදීමට උත්සාහ කරමු.**

### පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

السُّنَّةُ الحَدِيْثُ　　الصَّحَاحُ السَّتَّةُ　　الكُتُبُ السَّتَّةُ　　إِسْنَادٌ　　صَحِيْحَيْنِ

صَحِيْحٌ　　حَسَنٌ　　مَوْضُوْعٌ　　مَقْبُوْلٌ　　مَرْدُوْدٌ　　أَسْمَاءُ الرِّجَالِ

عِلْمُ الْجَرَحِ وَالتَّعْدِيْل

### අභ්‍යාසය

1. 'අස් සිහාහුස් සිත්තා' හෝ 'කුතුබුස් සිත්තාහි' අන්තර්ගත වන හදීස් ග්‍රන්ථ මොනවා ද?
2. 'සහීහ්' වන හදීස් යනු කුමක් ද?
3. 'සහීහෛයින්' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
4. හදීස් ක්ෂේත්‍රය තුළ දැඩි පරිශ්‍රමයක් දැක්වූ සහාබිවරුන් දෙදෙනෙකු නම් කරන්න.
5. ඉස්නාද් යන පදයේ තේරුම කුමක් ද?